**හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුත පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

---

1. මූල්‍ය ප්‍රකාශන

---

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, **හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.**

1.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

---

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

---

**පහත නිරීක්ෂණයන් කෙරේ.**

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම් බාරගන්නා බවට ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි.**

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18**

---

(i) ආයතනය දිගින් දිගටම ප්‍රයෝජනයට ගන්නා පිරිවැය රු.4,990,323 ක්වූ **මෝටර් රථ 09 ක් සම්පූර්ණයෙන් ක්ෂයකර මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ අගය ශූන්‍ය ලෙස දැක්වුවද, ඒවා ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.**

(ii) ආයතනයේ නිලධාරීන්ගේ දැනුම කුසලතා වර්ධනයට ලබාදෙන ශිෂ්‍යත්ව සඳහා වැයකරන ලද මුදල්වල එකතුව වූ රු.20,691,656 ක් ශේෂ පත්‍රයේ සේවක සංවර්ධනය නමින් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.2.2 **ගිණුම්කරණ අඩු පාඩු**

-----------------------

අයකර ගතයුතු රක්ෂණ වන්දි වූ රු.173,700 ක් මූල්‍ය ප්‍රකාශනයේ අයකරගත යුතු රක්ෂණ වන්දි ලෙස නොදක්වා වෙනත් ණයගැතියන් යටතේ දක්වා තිබුණි.

1.2.3 **නොසැසඳුණු පාලන ගිණුම්**

-------------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛන/ලේඛනයේ ශේෂයන් සමඟ නොසැසඳුණු අවස්ථා නිරීක්ෂණය විය.විස්තර පහත දැක්වේ.

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපලේඛනය/ලේඛනය | උපලේඛනය/ලේඛනය අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| --------- | ---------------- | ---------------------- | ----------------------- | ------- |
| | රු. | | රු. | රු |
| ප්‍රකාශන හා ජනල් | 1,456,482 | උපලේඛනය | 1,467,052 | 10,570 |
| පාරිභෝගික ද්‍රව්‍ය | 1,161,989 | -එම- | 1,159,364 | 2,625 |
| අලෙවි මධ්‍යස්ථානය | 332,329 | -එම- | 329,427 | 2,902 |
| සමාලෝචිත වර්ෂයේ පරිගණක හා පරිගණක උපකරණ මිලදී ගැනීම් | 830,294 | ස්ථාවර වත්කම් ලේඛනය | 712,274 | 118,020 |

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාකෂි නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ලී බඩු උපකරණ | 11,474,394 | (i) විස්තරාත්මක උපලේඛන |
| පරිගණක හා උපාංග | 2,571,807 | (ii) භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| | | (iii) 2009 වර්ෂයට පෙර මිලදී ගත් වටිනාකම් ඇතුලත් ස්ථාවර වත්කම් ලේඛන |
| මෝටර් රථ | 2,633,449 | (i) භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| පුස්තකාල පොත | 2,207,253 | (ii) 2009 වර්ෂයට පෙර මිලදී ගත් වටිනාකම් ඇතුලත් ස්ථාවර වත්කම් ලේඛන |
| බොල්ණය කපාහැරීම | 386,902 | අමාත්‍යංශ අනුමැතිය |
| මෝටර් රථ හා මොටර් සයිකල් ණය | 2,400,000 | වාහන මිලදී ගත් බවට ඉදිරිපත් කලයුතු ලියවිලි |

### 1.2.5 ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) සේවය අත්හැර ගිය සේවකයින් දෙදෙනෙකුගෙන් අයවියයුතු රු.234,732 ක ශේෂයක් වර්ෂ 4 කට අධික කාලයක සිට අයකරගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී සේවකයින් 20 දෙනෙකුට ලබාදුන් රු. 660,758 ක අත්තිකාරම් 2010 දෙසැම්බර් 31 දිනවන විටද නිරවුල් කරගෙන නොතිබුණි.

(iii) බාහිර ආයතන හා පුද්ගලයින් 08 දෙනෙකුගෙන් රු.461,742 ක මුදලක් වර්ෂ 01 සිට වර්ෂ 06 කටත් වැඩි කාලයක සිට ලැබිය යුතුව පැවතුණි.

(iv) මූල්‍ය ප්‍රකාශනවල 2008 වර්ෂයටත් පෙර සිට පැවැත එන හඳුනානොගත් ණයගැතියෝ (බැඳුම්කර) රු.110,374 ක් සමාලෝචිත වර්ෂයේදී ණයගැතියන්ගෙන් අඩුකර ගිණුම් ගත කර තිබුණි.

(v) පර්යේෂණ ව්‍යාපෘති 14 ක් අවසන්වීමෙන් පසු ඉතිරිවී තිබුණු රු.5,102,707 ක් 2009 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් යටතේ දක්වා තිබුණද එම මුදල් ආයතනයේ පුනරාවර්තන වියදම්වලට යොදවා ගෙන තිබුණු බැවින් ණයහිමියන් නිරවුල් කිරීමට ප්‍රමාණවත් මුදල් ආයතනයේ නොමැති බව 2011 අප්‍රේල් 07 දිනැති ලිපියෙන් ආයතනයේ අධ්‍යක්ෂවරයා දන්වා තිබුණි.

(vi) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ණයගැතියන් 18 දෙනෙකුගෙන් රු.453,955 ක මුදලක් අයකරගත යුතු වන අතර ඉන් 6 දෙනෙකුට පමණක් ණය පියවන ලෙස දන්වා ලිපි යවා තිබුණි.

(vii ) සේවය අත්හිටුවනු ලැබූ සේවකයෙකුගෙන් 2010 දෙසැම්බර් 31 දින වන විට අයවීමට තිබුණු හිඟ ණය මුදල වූ රු.98,991 ක් අයකරගෙන නොතිබුණි.

(viii) ණය යෝජනා ක්‍රමයෙන් ණය ලබාදුන් සේවකයින් 05 දෙනෙකු දැනට සේවයේ නොමැති අතර ඔවුන්ගෙන් අයවියයුතුව පවතින ණය ශේෂය රු.120,237 ක් විය.

(ix) 2010 දෙසැම්බර් 31 දිනට අයවියයුතු ශිෂ්‍යත්වලාභී ණයගැති ශේෂය රු.22,331,454 ක් වූ අතර ඉන් 06 දෙනෙකුගෙන් රු.11,438,649 ක මුදලක් අයවියයුතු වුවද වර්ෂය තුළ කිසිදු මුදලක් අයවී නොතිබුණි.

## 1.2.6 නීති,රීති රෙගුලාසි හා කළමණාකරන තීරණ යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය , 371(2) | තත්කාර්ය අතුරු අග්‍රිමයන් වශයෙන් රු.20,000 ඉක්මවා අවස්ථා 10 කදී රු.130,000 ක් ලබාදී තිබුණි. |

(ආ) චක්‍රලේඛ

| | |
|---|---|
| (i) අංක 41/90 හා 1990 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය | ධාවන තත්ත්වයේ ඇති වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳව මාස 6 කට වරක් කළයුතු ඉන්ධන පරීක්ෂාව 2005 පෙබරවාරි 01 දිනෙන් පසුව සිදුකර නොතිබුණි. |
| (ii) අංක 01/2002 හා 2002 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 9.3.1 ඡේදය | ආයතනය විසින් ප්‍රයෝජනයට ගන්නා ආයතනයේ වාහන 7 ක් මත රාජ්‍ය ලාංඡනය පින්තාරුකර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය | (i) වාහන අලුත්වැඩියා සඳහා මිල කැඳවීම් කර නොතිබුණු අතර,ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවන ආයතනයකින් වාහන 11 ක් අලුත්වැඩියා කර ගැනීම සඳහා රු.1,391,197 ක වැයකර තිබුණි.<br>(ii) ටෙන්ඩර් ක්‍රියාවලිය විධිමත්ව අනුගමනය නොකර වායු සමීකරණ යන්ත්‍ර 28 ක් මිලදී ගෙන රු.1,509,206 ක් ගෙවීම්කර තිබුණි. |

## 1.2.7 අධිකාර බලයෙන් තොර ගනුදෙනු

------------------------------------

භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආයතනයේ සේවකයින්ට නිවාස ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුවක රු.2,000,000 ක මූලික තැන්පතුවක් තබා එම තැන්පතුව පදනම් කර ගෙන ණය දීමට 1993 වර්ෂයේ ගිවිසුමකට ඇතුලත් වී තිබුණි.
ඒ අනුව වර්ෂය අවසානයේ පැවති තැන්පතු මුදල වූ රු.2,361,944 ක් ඉක්මවා ලබා දුන් රු.1,629,394 ක ණය, ශේෂ පත්‍රයේ ජංගම වගකීමක් ලෙස දක්වා තිබුණි. ආයතනයේ අරමුදලින් පවත්වා ගෙන යන නිවාස ණය යෝජනා ක්‍රමය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.13,298,964 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,647,506 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයෙ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,651,458 ක පිරිහීම සඳහා පරිපාලන වියදම් ඉහල යාම හා භාණ්ඩාගාර ප්‍රදාන අඩුවෙන් ලැබීම යන කරුණු බලපා තිබුණි.

### 2.2 කාර්යසාධනය

----------------

සමාලෝචිත වර්ෂයේ ආයතනය ආරම්භ කරන ලද ව්‍යාපෘති 15 ක් හා පෙර වර්ෂයේ ව්‍යාපෘති 04 ක් සමාලෝචිත වර්ෂයෙ ක්‍රියාත්මක කර තිබුණි. එයින් ව්‍යාපෘති 14 ක් 2010 වර්ෂයේ අවසන් කර තිබුණද වටිනාකම රු. 5,572,435 ක්වූ ව්‍යාපෘති 02 ක් සඳහා අවශ්‍ය මුදල් හා තොරතුරු නොලැබීම මත අත්හැර දමා තිබුණි.

### 2.3 කළමණාකරන අකාර්යක්ෂමතා

----------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) වැටුප් රහිත නිවාඩු ලබා විදේශ ගත වීමට පෙර සියලු ණය මුදල් පියවිය යුතු වුවද 2009 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු ලබා විදේශ ගතවූ නිලධාරියෙකුගෙන් 2010 දෙසැම්බර් 31 දින වන විට රු.99,362 ක ණය මුදලක් අයවීමට තිබුණි.

(ii) වියදම් කිරීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණයන් නිවැරදිව තක්සේරු කිරීමකින් තොරව නිලධාරීන් 14 දෙනෙකු රු.270,000 ක අත්තිකාරම් මුදලක් ලබා ගෙන දින 4 සිට දින 14 දක්වා කාල පරාසයකින් පසු රු.199,497 ක මදලක් ආපසු පියවා තිබුණි.

(iii) නිලධාරීන් තිදෙනෙක වෙනුවෙන් අවස්ථා 08 කදී ලබාගත් අත්තිකාරම් මුදල පියවීමට පෙර නැවත අතතිකාරම් මුදල් ලබා දී තිබුණ.

(iv) පුද්ගලයින් විසින් රැගෙන ගොස් ආපසු බාරදී නොමැති පුස්තකාලපොත් 285 ක් හා විනාශ වී තිබුණු පොත් 129 ක් සම්බන්ධයෙන් ආයතනය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(v) ආහාර හා කෘෂිකර්ම සංවිධානය සතු අංක 65-1280 දරන පැජරෝ ජීප් රථය පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි.

## 2.4 වත්කම් කලමනාකරණය

කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යංශය යටතේ පැවැති සංචාරක බංගලාව ආයතනය වෙත භාරදී අවුරුදු 06 ක් ගතවී ඇතත් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් එහි නීතිමය අයිතිය ආයතනය වෙත පවරාගෙන නොතිබුණි.

## 2.5 මානව සම්පත් කළමණාකරනය

පහත කරුණු නරීක්ෂණය විය.

(i) ආයතනයේ කාර්ය මණ්ඩලය අනුමත කරවාගෙන නොතිබුණි.

(ii) ආයතනයේ පවත්වාගෙන යනු ලබන කාර්ය මණ්ඩල වාර්තාවේ නොමැති තනතුරු 03 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර තිබුණු අතර, අනුමත වයස් කාණ්ඩය ඉක්ම වු තිදෙනෙකුද අනයම් පදනම මත බඳවා ගෙන තිබුණි.

(iii) අනියම් පදනම මත බඳවාගෙන තිබුණු සේවකයින් 04 දෙනෙකුගේ සේවා කාලය අවසන් වී තිබුණද සේවය අවසන් කර හෝ සේවා කාලය දීර්ඝ කර හෝ නොමැතිව සේවයේ යොදවා තිබුණි.

(iv) නඩත්තු නිලධාරි තනතුර සඳහා බඳවා ගනු ලබන දිනට තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය හිමි අයකු පත්කළ යුතු නමුත් 2008 වර්ෂයේ බඳවා ගනු ලැබු නඩත්තු නිලධාරියා සඳහා එදිනට සුදුසුකම් සපුරා නොතිබියදී බඳවා ගැනීම සිදුකර තිබුණි.

(v) ආයතනයේ නිත්‍ය තනතුරු 7 ක් සඳහා ස්ථිර පත්වීම් සිදු නොකර මාස 7 සිට මාස 41 දක්වා කාල පරාසයන් සඳහා වැඩ බැලීමේ පදනම මත පත්කර රු.367,360 ක ගෙවීම් සිදුකර තිබුණි.

(vi) කාර්යභාරයන් පැවරීමේ පදනම මත හා කොන්ත්‍රාත් පදනම මත 2010 ජූනි මාසයේ සිට සේවකයින් 22 ක් බඳවා ගෙන තිබුණු අතර, ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණක් ලබාගෙන තබුණි.

(vii) 2010 වර්ෂය තුලදී අනුමත බඳවා ගැනීම් පරිපාටියෙන් බැහැරව සේවකයින් 33 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 15 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

**2.6 අයවැය ලේඛනමය පාලනය**

------------------------------

අයවැයගත උත්ත හා තථ්‍ය දත්ත අතර සැලකිය යුතු විචලනයන් වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

**03. පද්ධති හා පාලනය**

---------------------

විගණනයේදී නිරීක්ෂනය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(i) සේවක කලමනාකරණය
(ii) අත්තිකාරම්
(iii) සෙවක ණය
(iv) ස්ථාවර වත්කම් කලමනාකරණය
(v) ආදායම් ගිණුම්